IHRA
UNIVERSITY OF COLOMBO

# සිංහල පාරිභාෂික පද සාධනයේ දී ඇති වූ මතවාද පිළිබඳ අධ්‍යයනයක්

විභාග අංකය :**LE3818**

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධියේ අවශ්‍යතා
සම්පූර්ණ කිරිම සඳහා ඉදිරිපත් කරනු
ලබන ව්‍යාපෘති වාර්තාව

මානව සම්පත්අභිවර්ධන ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
කෙළඹ 07

2022 - සැප්තැම්බර්

Library
2022
S2
Institute of Human Resource Advancement

## සාරාංශය

සිංහල භාෂාවේ මෑත ඉතිහාසය සලකා බලන විට 50-60 දශකය ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි. පාරිභාෂික පද සාධනය වශයෙන් එදා අදහස් කෙරුණේ වර්තමානයේ අප අදහස් කරන දෙය නොවේ. යටත් විජිත තත්වයෙන් මිදී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්ව පරිපාලන කටයුතු සඳහා යොදා ගැනීමත්, එතෙක් ඉංග්‍රිසි භාෂාවෙන් පැවතුණා වූ පාසල් විෂය මාලාව සිංහලය කිරීම හා ඉන් ඔබ්බට ගොස් විශ්වවිද්‍යාල අධ්‍යාපනය අරක්ගෙන සිටි ඉංග්‍රීසිය ඉවත් කොට එය සිංහල මාධ්‍යය බවට පත්කිරීමත්, ඒ සඳහා අවැසි සිංහල වචන සැපයීමත් ය. මේ කාර්යය නිසා විවිධ විෂයය උදෙසා සිංහලෙන් නව ශබ්ද සම්පාදනය කිරීම එතෙක් කිසි දිනෙක නොවූ විරූ අභියෝගාත්මක අභ්‍යාසයක් බවට පත් විය. මෙය භාෂාව පිළිබඳ නව අත්හදාබැලීමක් මෙන්ම සාහිත්‍යය, නාට්‍යය, ආයුර්වේද, ඉතිහාසය, ජ්‍යෝතිෂ්‍යය, සිංහල, පාලි, සංස්කෘත ආදී වූ පැරණි විෂයය පථයෙන් පිටතට ගොස් නූතන විද්‍යා, උසස් ගණිතය, ඉංජිනේරු ශිල්පය, අධිකරණ ආදී ක්ෂේත්‍ර සම්බන්ධව විද්‍යා විඥානය ව්‍යාප්ත කිරීම පිළිබඳ ගනු ලැබූ ප්‍රයත්නයක් ද විය.

සිංහලය රාජ්‍ය භාෂාව බවට පත්වීමත් සමඟ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවට පාරිභාෂික පද සම්පාදනයේ මූලික වගකීම හිමි වුව ද ඊට බොහෝ කලකට පෙර සිටන් ම සිංහල ලේඛකයින් හා භාෂා ශාස්ත්‍රඥයින් එම කාර්යයේ නිරත විය. එහි දී විවිධ මතවාද. අදහස් හා තර්ක විතර්ක ඉදිරිපත් වූ අතර ඒවාට නිශ්චිත විසඳුමක් ලබා දී පොදු නිගමනයකට එළඹීම විසි එක්වන සියවසේ තුන්වන දශකයේ අරම්භයට පැමිණ සිටිය ද එය තවමත් අප හමුවේ පවතින අභියෝගයකි. පාරිභාෂික පද සාධනයේ දී ඇති වූ අදහස් හා මතවාද පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම නිබන්ධයේ මූලික අරමුණ වේ. භාෂා සැලසුම්කරණ විෂයයෙහි මූලික ස්ථානයක් හිමිකර ගන්නා පාරිභාෂික පද සාධනය භාෂාවේ සංවර්ධනය සඳහා ඉවහල් වේ. එබැවින් වැටහෙන සුළු, පහසු, සරල, සම්මත රීතියක් යොදා ගනිමින් පාරිභාෂික පද සාධනය සිදු කළ යුතු ය. මෙම අධ්‍යයනය මඟින් යටත් විජිත යුගයේ සිංහල භාෂාව, රජ්‍ය භාෂාවක් හා අධ්‍යයන මාධ්‍යයක් ලේස සිංහල භාෂා භාවිතය නවීකරණය සහ නව වචන නිපදවීම, පාරිභාෂික පද සාධනයේ දී රජ්‍ය හා පෞද්ගලික මැදිහත්වීම පිළිබඳව අධ්‍යනය කිරීම මෙන්ම ඉදිරිපත්ව ඇති ගැටලු හා මතවාද වල ශක්‍යතා හා දුර්වලතා හඳුනා ගැනීමත් සිදු වේ.

# පටුන


| | පිටුව |
|---|---|
| ස්තුතිය | ii |
| සාරාංශය | iii |
| **පළමු පරිච්ඡේදය** | |
| හැදින්වීම | 1-3 |
| අධ්‍යයනයේ පසුබිම සහ ක්ෂේත්‍රය | 4 |
| අධ්‍යයනයේ වැදගත්කම | 5 |
| පර්යේෂණ ගැටලුව | 6 |
| **දෙවන පරිච්ඡේදය** | |
| සහිත්‍ය විමර්ශනය | 7-10 |
| **තෙවන පරිච්ඡේදය** | |
| පර්යේක්‍ෂණ ක්‍රමවෙදය | 11 |
| අධ්‍යයනයේ සීමාවන් හා දුර්වලතා | 12 |
| **සිව්වන පරිච්ඡේදය** | |
| යටත් විජිත යුගයේ සිංහල භාෂාව | 13-18 |
| **පස්වන පරිච්ඡේදය** | |
| 5. රාජ්‍ය භාෂාවක්,අධ්‍යයන මාධ්‍යයක් ලේස සිංහල භාෂා භාවිතය | 19-42 |
| 5.1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා සිංහල භාෂාව | 20-30 |
| 5.2. අධ්‍යාපන මාධ්‍යයක් ලේස සිංහල භාෂාව භාවිතය | 31-42 |
| **හයවන පරිච්ඡේදය** | |
| 6.1. සිංහල පාරිභාෂික පද සාධනයේ දී ඇති වූ ගැටලු හා මත | 43-54 |
| 6.2. පෞද්ගලික මැදිහත්වීම හා ඉදිරිපත් වූ අදහස් | 54-81 |
| 6.2.1. මාර්ටින් වික්‍රමසිංහ මහතා | 54-64 |
| 6.2.2. කුමාරතුංග මුනිදාස මහතා | 64-76 |
| 6.2.3. ඊලියත් ද සිල්වා මහතා | 76-81 |
| **හත්වන පරිච්ඡේදය** | |
| සමාලොචනය | 82-86 |
| ආශ්‍රිත ග්‍රන්ථ | 87-90 |